# ප්‍රාතිහාර්ය්‍ය ශතකය,

# PRATIHARYASATAKAYA

අ ච්චු ග ස න් ට යෙ දු ණේ

කො ළ ඹ,

ලඞ්කාභිනව විශ්‍රැත සමාගමේ

යන්ත්‍රසාලාවේදිය.

COLOMBO:

1864.

මීල සිලින් 1, පැන්ස 6.

# ප්‍රාතිහාර්‍ය ශතකය.

# PRATIHARYASATAKAYA

අ ච්චු ග ස න් ට යෙ දු ණේ
කො ළ ඹ,

ලඞ්කාභිනව විශ්‍රැත සමාගමේ
යන්ත්‍රශාලාවේදිය.

COLOMBO:

1864.

## යමක ප්‍රාතිහාර්‍ය්‍ය ශත ක

## නො හො ත්.

## ප්‍රාති හාර්‍ය්‍ය ශත කය.

### මෙම ප්‍රකරණ යෙහි අභිප්‍රාව ණ මි.

සර්වඥ රාජොත්තමයන් වහන්සේ වැඩවදාළාවූ ජේතවණ මහවිහාරයෙහි නෛකාලඞ්කාරහා බෝ මැඩවිදුරසුන්හිදී අතිරෞද්‍රවූ මාරදිව්‍ය පුත්‍රයාඇතුළුවූ මාරාඞ්ගණාවන්විසිනුත්—කළාවූයුද්ධයන් තමන්වහන්සේ ජයග්‍රහණයකළාවූ දශපාරමිතා පරාක්‍රමයන්ද ගණ්ඩම්බනාම් ආම්‍රවෘක්ෂමූලයෙහිදී තීර්ත්‍ථකයන් නිසා ත්‍රෛලොක්‍යය විස්මපත්කොට නානාප්‍රකාරයෙන් පෑවාවූ ප්‍රාතිහාර්‍ය්‍යන්ද—එමපෙළගැරේදී—අනන්තනාම් නාරජවිසින් කථනයකළාවූසර්වඥයන් වහන්සේගේ අප්‍රමෙය්‍ය රූපවිලාසද, සංස්කෘතභාෂාවටනොහොත් සිංහලභාෂාවට නාගාජූනස් ව්‍යාකරණ කාව්‍යාලඞ්කාරයෙන් යුක්තකොට ශ්‍රවණයකරණ්ණවුන්ට කර්ණාරසායනයෙන් මනෝනන්දනය කරණපරිද්දෙන් ශ්ලොකසියයකින්හා එයටකලස නාන්‍යසියයකින්ද කරණලද මෙම්ප්‍රකරණය රචනාකල කර්තෘහුගේ නාමයමෙහිප්‍රකාසනොවණහෙයින්, නිස්සාඞ්කාවකියනොහැකි වණනාමුත් ලොකව්‍යවහාරයෙන් නෛකවිචිත්‍රකාව්‍යශාස්ත්‍රාති දක්ෂකීරම ධම්මානන්දයති තුමාටගුරුවූ ශාලිඇලේ ස්වාමිපාදයන්විසින් රචනාකලායයිකියත්

මෙශාස්ත්‍රාධ්‍යයනය කරණ බාලජනයාට සහ

ශාස්ත්‍රාද්ග්‍රන්ථකලාවූ පණ්ඩිතජනයාටද බුද්ධ ගුණශ්‍රවණීයාභිලාෂයන්ටත්, ඉතාරමණීයවූ ප්‍රකරණයක් බවසලකන්නාවූ අපවිසින් මෙම්පොත්කීපයක් එකතුකොට බලාලිපිදෙෂයෙන් ජාතානොනෙක්වරද සංශොධිතකොට අච්චුගසවා ප්‍රසිද්ධකරන්ට යෙදුනේ—

දෙම් පිලිප්ද සිල්වා ඇපා අප්පුහාමි විසින්ය.

# ප්‍රාතිහාර්‍ය්‍ය ශතකය.

---

නමව් මුණි සරණ.

මුණි, සර්වඥයන්වහන්සේගේ, සරණ, ශ්‍රීපාදද්‍වයට, නමව්, නමස්කාරකරව්.

( 1 )

සුරිඳු පුරපසස්නා නන් සුරඹුසිත් සතොස් නා
දෙවිඳු අඟනිවෙස්නා සව් සැපත් රුස් නිරුස් නා
මනරඟ රඟ පුන්නා නන් විමන්පස් නුමුස් නා
පුරපවර පසස්නා වී සැවැත් මී සදි ස් නා

සැවැත්පුරපවර, ශ්‍රාවස්තිනම්පුරෝත්තමයෙක්, වී, වූයේය.

යනුවෙහි ක්‍රියාකාරකපද සම්බන්ධයි.

(කෙබඳුවූ ශ්‍රාවස්තිපුරයෙක්දයත්)

නන්සුරඹු, නොයෙක්දෙවඟනන්ගේ, සිත්සතොස්නා, චිත්තසන්තොෂකරන්නාවූ, දෙවිඳුඅඟනිවෙස්නා, සක්දෙවිඳුහටඅඟනිවෙස්වූ (නොහොත්) අග්‍රරාජයන්වනිවාසස්ථානවූ, මනරඟ, මනොරඤ්ජනය කරණ්නාවූ, රඟපුස්නා, නාට්‍යයෙන්පූර්ණවූ, (නොහොත්) යුක්තවූ, නන්විමන්පස්නුමුස්නා, (නානාවිමානාදි) අනේකප්‍රකාර ප්‍රාසාදකාන්තියෙන්නිර්මුක්තවූ, (නොහොත්) සාකුලවූ, රුස්නා, රඤ්ජිතවූ, සව් සැපත්රුස්නි, සියළුසම්පත්තිරාසින් කරණකොට

යොණ, දූරිදූපුරපසන්නා, ශක්‍රපුරයප්‍රකාශකරන්
නාවූ, පසන්නා, (එහෙයිම්මලොකයාවිසින්) ප්‍රශංස
නීයවූ, සැවැත්පුරපවර, ශ්‍රාවස්තිනම්පුරොත්තම
යෙන්, මීසදිස්තාවී, ඓශ්වර්යාභිසදෘශමානාවූයේය
(හෙවත්) ප්‍රාදුර්භූතවී

( 2 )

පවර පුර ලකල් කල් නිල් මෙවුල් දම් විලස් වූ
පිරි පිවූ කල හස් ලොල් කල් වියෝවූ තැංබෙ ස්
දූ තැපලිමිනිපව්රේ කල්කුහුල් නෙන්නැගිමෙන්
නුබතල බිත ගැස්මෙන් තොස්සතැවිලි සැපත් වී

පවර, උත්තමවූ, පුර, (ශ්‍රාවස්ති) පුරනමැති, ල
කල්, මනොඥවූ, කල්, වනිතාවන්ගේ, නිල්මෙවුල්ද
ම්විලස්වූ, ඉන්ද්‍රනීලමාණික්‍යමේඛලාදාමයකටබඳුවූ වි
ලාසඇති, පිරිපිවූ, පරිබාමිසනකයෙහි, කලහස්, කා
ලහංසතෙම, ලොල්, එබිබ දූයේ, වියෝවූකල්, විප්‍රවා
සයට පැමිනියාවූ හංසදෙනුවෝඇත්තේ, පිළිමිනි
පව්රේ, සඵටිකමාණික්‍යප්‍රාකාරයෙහි, තමාසේදූතැ,
තමාගේඡායාවදුක, කුහුල්නෙන්, (සවනීයකාන්තා
විද්‍යොතයියන) කාංශාවෙන්, නුබතලනැගීමෙන්,
ආකාසතලයටනැගීමෙන්ද බිතගැස්මෙන්, (නැගී
ප්‍රාකාර) භිත්තියෙහි (තමාගේකාය) ප්‍රහාරයෙන්ද,
තොස්සතැවිලි, සන්තොෂයටහා සන්තාපයට, සැප
ත්වී, සම්ප්‍රාප්තවී

( 3 )

මිනිමුතු නිලිප්පුල්නෙත් හෙම්හසුන් පුත්තෙනෙත් දුත්
පිලිවිනි කනාපව්රෙන් පත්විසල්සේ කසුන්ව ත්
බමරවැලවෙලාඋ පුල්සහස් පත් සු රත් අ ත්
ඒපුරපිරිලකල්වූ කල්බඳෙව් ලෝනුව න් ග ත්

මිණිමුතු, මනිමුක්තවූ, (හෙවත්) පිපියාවූ, නිලුප්
ල්නෙත්, නීලෝත්පලනමැතිනේත්‍රඇති, හෙම්හ

සුන්, සුවර්ණහංසයන්නමැති, පූන්නෙතෙනන්සුත්,
පීනපයෝධරයෙන්යුක්තවූ, පිළිම්නිකනපවිරෙන්,
ඇවානනා සුවර්ණයෙන්නිර්මිතවූප්‍රාකාරයෙන්, පත්,
පැමිනියාවූ, විසල්, පෘථුලවූ, සේ, ජාසාවනමැති,
කාසුන්වත්, කාචනවසත්‍ර ඇති, (හෙවත්) රංකාංකලු
පිලිඇති, බමරවැල, භෘඞගශ්‍රෙනින්නමැති, වෙලා
ඇ, ලනලදවලළුඇති, පුල්සහස්පත්සුරත්අත්,
ප්‍රබුඩවූපද්මනමැතිසුරක්තවූ හසතතලඇති, ඒපුර,
(ශ්‍රාවස්තිනම්) පුරයෙහි, පිරී, පරිඛානොමෙර්, ලක
ල්වූ, අලඞකාරවූ, කල්බදෙව්, ස්ත්‍රියකමෙන්, ලොනු
වන්ගත්, ලොකායාගේනේත්‍රපැහරගත්තී—

( 4 )

මිනි කිකිනි දූලින් හා කේලිදෙව්නි සි රි න් හා
ඒ පුරකුළුදෙලෙන් හා පත්මුදුන්සේ ර සි න් හා
කැ ර ලිති සුලගින් හා නන්අගින්පත් සුදි න් හා
බුජඟ වැජ ඹෙමින් හා පැතිනෙත්හා බෙරි න් හා

මිනිකිකිනිදූලින්හා, මානික්‍යමයකිංකිනිජාලාලං
කාරණකොටගෙණ, කේලි, පතාකනමැති, දෙව්
නිසිරින්හා, ආකාසගඟාශ්‍රියෙන්ද, කුළුදෙලෙන්
හා, (අග්‍ර) කූටනමැතිජටාවෙන්ද, මුදුන්පත්, (ප්‍ර
සාද) මස්තකප්‍රාප්තවූ, සේරසින්හා, සිතරස්මිගුක
රණකොටගෙණ, කැරලිතිසුලගින්හා, කොත්න
මැතිත්‍රිසූලාග්‍රයෙන්ද, නන්අගින්පත්සුදින්හා, ගස්
තපාදදීහු (දෝහො නොහොත්) භිත්තිප්‍රාකාරාදිඅ
වයවයෙන් පැමිනියාවූ ධවලගණයෙනද, බුජඟවැජ
ඹෙමින්හා, සර්පයන්ගේවිජෘම්භමානයෙනද, (නො
හොත්) ධූතියන්ගේපැලඹීමෙනද, හාබෙරින්හා,
හාටකහෙරින්(දෝහෝ නොහොත්)මෘදඞගාදිහෙ
රිවගීනයකරණකොටගෙන, ඒපුර, ඒ (ශ්‍රාවස්තින
ම්) පුරයෙහි, (ප්‍රාසාදනමැති), තිනෙත්පෑ; ත්‍රිනේ
ත්‍රයාදක්වූ—

( 5 )

විදුහුබඳදෙදෙන්සන් නිල්මිනෙන්වමිවින් හි
දුනැ උවිනාතයෝනන් තන්හිතන්හිදොරේරෙන්
ගෙසරසයුගසක්වා මේකුලින්බිමදිස් නා
ඒසොරතුසරපායය් පත්සතැවිලිපුරේ හි

විදුහුබඳදෙබෙදන්සන්, විද්‍යුත්අනුබද්ධවූධවජයෙන් සංපන්නාවූ, (හෙවත්) විදුලියවැනි සවර්ණපතාකායෙ න්ගැවසිගත්තාවූ, නිල්මිනෙන්වූවිමන්හි, ඉන්ද්‍රනීල මාණික්‍යයෙන්නිෂ්පන්නවූ විමානවල්හි, තන්හිත න්හි, ඒ ඒ ස්ථානයෙහි, දොරේරෙන්, වාරගෘහන්තර යෙන්, යෝනන් උවිනාතදුනැ, පූර්වවධූන්ගේමුඛා වලොකනයකොට, පූරේහි (ශ්‍රාවස්ති) පුරයෙහි, ගෙසරස, ගෘහදීර්ඝිකායෙහි, (හෙවත්) ගෘහසමීප විල්හි, යුගසක්වා, චක්‍රවාකයුග්මයෝ, ඒසොර, ඒචොර වූ, තුසරපායය්, තුසාරපාදයාද්‍යෙහොයි, (හෙවත්) සඳ ද්‍යෙහොයි, සතැවිලිපත්, සන්තාපයටපැමිනිවී~

( 6 )

සුසැදි සැලලිහන්ගේ පත්සවන් නිල්නුවන් හි
සලෙළු වනලලත්සිත් තන්හිතන්හි පුරේ හි
සියකැමි නොබලත්වූ මල් සර මල් සර පස්
නමහටෙහි බැහුගය් මම් හඟිම් සැවිනොදීඅ ත්

පූරේහි, (ශ්‍රාවස්ති) පුරයෙහි, සුසැදි, මනාකො ටසැරසුනාවූ, සැලලිහන්ගේ, සලීලාලක්ෂ්මීන්ගේ, සවන්පත්, කර්ණාන්තයටපැමිනියාවූ, නිල්නුවන්හි, අතිසයින්නිල්වූ නෙත්‍රනාමැතිසැරයෙන්, තන්හිත න්හි, ඒ ඒ ස්ථානයෙහි, සලෙළුවන්, සලීලාලපුෂීයන්, සිත්අලලත්, චිත්තක්ෂෝභකරවත්, සියකැමිනොබ ලත්වූ, ස්වකීයක්‍රියායෙන්දුර්වලවූ, මල්සර, අනඟ තෙමෙ, මල්සරපස්, කුසුමසැරය න්පස්දෙනා, සැවි

නොදීඅත්, වාපශෙහිඅත්නොලා, තටහටෙහිබැ
ඳුහය්, තමාගේතුහිරයෙහ්බැඳුහයි, මිම්හසිම්, මම
සිතම්

( 7 )

එපුරවෙහිගජන්කැන් රවිසියන්පාඇකිල්ලේ
කුඹුටුකලගිගුම්ගත් මීලොලින්මීලොඑන්අද්
දෙසවනතිනපත්වූ වාවේයින්හස්ලදින්එත්
තුරඟකුරගසින්පත් රෙණරසින්මීමැවූඑවි

ඒපුර, ඒ (ශ්‍රාවස්ති) පුරයෙහි, වෙහි, (රාජ)වීථියෙහි, ගජන්කැන්, (නිරන්තරයෙන්සචාරණයකාරණවූ) හස්තිසමූහයාගේ, පාඇකිල්ලේ, පාදශෘංඛලාදමයෙහි, රවිසියන්, රවශතයන්, (ශබ්දසියගණන්) කුඹුටුකල, ඝටකලාවූ, ගිගුම්ගත්, නාදවත්වූ, මීලොලින්, මධුලොලත්වයෙන් (ආවාවූ) මීලොඑන්, මධුකරයන්ගෙන්,අද්,ආද්‍රවූ, දෙසවනතින, කර්ණාන්තයෙන්, පත්වූ, පැමිනියාවූ, වාවෙයින්, වාතවේගයෙන්, හස්ලදින්එත්, ප්‍රහාරලදින්(භූමියෙහි) එනනාවූ, තුරඟ, අශ්වයන්ගේ, කුරගසින්, ඛුරඝට්ටණයෙන් (නැංගාවූ)රෙණරසින්, පරාගසමූහයෙන් (හෙවත්) ධූලියෙන්,මීමැවිඑවි,පෘථිවියක්මවනලදැය්සිතම්

( 8 )

පිලිම්නිතොරණින් සන්නිල්මිනොන්වූවිමන් හි
පලහෙලගණනිල් පැපත්එමාවේ පුරේ හි
අඳරඅතරකල්හි රන්ලියන්මෙන් සදිස් නා
සරණබිසරුවන්සිත් තැවිලිදන්වීසතොස් හා

පුරේහි, (ශ්‍රාවස්ති) පුරයෙහි, එමාවේ, ඒ මහාවීථිතොමෝ, (උභයපාර්ශ්වයෙහි) පිලිම්නිතොරනින්සන්, ස්ඵටිකමාණික්‍යමය තෝරණයෙන්සංජන්නවූ, නිල්මිනොන්වූවිමන්හී, ඉන්ද්‍රනීලමාණික්‍යයෙන් නිෂ්පන්

නාවූ ප්‍රාසාදයන්හි, පලඟොල, විකප්තාවිධවලවුපැහැ යම්ද, ගනාහිල්පැපත්, සාන්ද්‍රවූනිල්පැහැයටදපැමිනි, අඳුරඅනාරකල්හි, අන්ධකාරයව්‍යාප්ත වූකාලයෙහි, (හොවත්)රාත්‍රිභාගයෙහි, රන්ලියන්මෙන්සදිස්නා සවර්ණලතාවන්මෙන්දෘශ්‍යමානවූ (හෙවත්) සංචාරණයකාරන්නාවූ, අබිසරුවින්සිත්, අභිචාරිකාවන්ගේචිත්තයන්ට, සතොස්හා, සන්තෝෂයහා, තෑවිලි දන්වී, සන්තෝෂයඉපදවී.

( 9 )

දෙපසසටගනන්වූ කෝලිතෙවිනාරලින්ස න්
නිතිසරණනාරන්කැත් මින්කැලන්ගෙන්ඳූපූන් වූ
නි රි ඳු රු ඳු එ පා යෙ න් ප ත් එ මා වේ පු රේ හි
සිරිනුදුලහිමවිපව් වෙන්නිකුත්නිවිලස් පෑ

දෙපසසටගනන්වූ, උභයපාර්ශ්වයේ යෂ්ට්‍යග්‍රයෙහි නන්වනලද, කෝලිතෙවිනා ශොබනාපතාකානාමැති, රලින්සත්, තරඟ(ලීලායෙන්) සංජන්නවූ, නිතිසරණනාරන්කැත්, නිරන්තරයෙන්සංචාරණයකාරණාවූ මනුෂ්‍යසමූහනාමැති, මින්කැලන්ගෙන්, මත්ස්‍යසමූහයාගෙන්, ඳූපූන්, සම්පූර්ණවූ, නිරිඳු, නරෙන්ද්‍රයන්ගෙන්, රුදු, රංජමානවූ, එපායෙන්, ඒ ප්‍රාසාදයෙන්, පත්, පැමිනියාවූ, එමාවේ, ඒ මහාවීථිතොම, පුරේහි, (ශ්‍රාවස්ති)පුරයෙහි, සිරිනුදුල, ශ්‍රීන්ට ජ්වලිතවූ, හිමවිපව්වෙන්නිකුත්, හිමාලපර්වත (සමීපයෙන්) නිස්ක්‍රාන්තවූ, නිවිලස්පෑ, ගංගා(ශ්‍රී)විලාසයත්දැක්වූ.

( 10 )

මදහසපනාදීමෙන් ලාමොයෙක්මත්තෙපුල් ලා
පියසුරුවුරුවල්හි නිල්වසාපානැයිමෙ න්
බැමලිනසැරසුත්හි ලානුවන්හිකළුන්ගොස් ස්
විදුතුඹුවකැලත්වි වල්සරන්මෙන්පුරේ හී

මදගඤපනදීමෙන්, මඤස්මිතනැමති වටකොටප න්ඇදීමෙඤ, නොයෙක්, අනේකප්‍රකාරයෙන්, මත්තෙපුල්ලා, (අතගොත) මතවකිඃන්නාවූවචනන මැති (සංලා), පිඃයුරඃ පයොධරනමැති, වුරුවල්හි, මහාරණ්‍යයෙහි, නිල්වසා, නීලවූවසාරජ්ජනමැති, පානැගීමෙන්, පඃනැගීමෙන්ද,බැමිලීඃසැරසුත්හී, ශැලතානමැතිශරසානයෙහි(ගෙවත්)දුන්නෙහි, නුවන්ලා,නේත්‍රනමැති බානබහා, කළුන්ගොස්, ධූතිසත්‍රීන්ගොස්, වල්සරන්මෙන්, වනවරයන්පරිද්දෙන් (ගෙවත්) වැද්දන්මෙන්, පුරේහී, (ඒ ශ්‍රාවස්ති) පුරයෙහි, විදුතුමූවකැලන්වී, විදිනාලද (ධූතිපුෂීඃන්නමැති)මෘගඃයුළුඃක්වී

( 11 )

මුළුසලෙළුදනන්ගේ සිත්සතොස්නා අවන්හ ල්
දිගතිනොසලවෙස්රුස් නෙත්සතප්නාවිසල්ස ල්
ඇමතිගෙණෙහසුන්කැන් සිත්සෙලග්නාසුපුප්වි ල්
ළුපුර ළුපුරවැස්සන් සිත්මිනෙවිසිත්සතොස් වී

මුළුසලෙළුදනන්ගේ, සිඃළුනාගරිකජනඃන්ගේ, සිත්සතොස්නා, චිත්තසන්තොෂකරවන්නාවූ, අවන්හල්, ආපානසාලාවන්, දිගතිනොසල, ඒ ඒදිගින්රුස්වූ වෙස්රුස්, ව්‍යාපාරසමූහයාගේ, නෙත්සතප්නා, නේත්‍රසන්තර්පණයකරණ්ණාවූ, විසල්සල්, මහත්වූ සල්පිලෙක, ඇමතිගෙණෙ, ආමාත්‍යමණ්ඩලයානමැති, හසුන්කැන්, හංසසමූහයා, සිත්සෙලග්නා, ඉච්ඡාවූපරිද්දෙන්වාසයකරණ්ණාවූ සුපුප්විල්, සුපුෂ්පිතවූ තටාකවූ, ළුපුර, (ඒශ්‍රාවස්ති) පුරය, ළුපුරවැස්සන්, ඒ පුරවැසියන්ගෙ, සිත්මිනෙවි, තින්තාමාණිකායයක්පරිද්දෙන්, සිත්සතොස්වී, චිත්තසන්තොෂවී

( 12 )

මේතුන්ලෝවැසිනන්දනා නෙතදනානන් මල්සුපුප් (විල්රුසින්
නන්පෑපත්කුළුගේසියෙන් බිහිදෙරින් තැන්තැන්හි (දුන්රණදදෙන්
දුල්වූනන්වැටුපෙන්සැදුන් ලදඇගෑරුස්නෙන්සහස් (රුස්දිනු
දේනානම්වෙහෙරෙක්දවී පුරවරේ වෙත්හිසැවැත් (හිඑකල්

මේතුන්ලෝවැසිනන්දනා, මේත්‍රෛලොක්‍යවාසි නානාජනයාගේ, නෙතදනා, නේත්‍රාකර්ෂණකර ණවූ, (කුමකින්දයත්) නන්මල්සුපුල්විල්රුසින්, අනේකපුෂ්පපුෂ්පිතතටාකරාසියෙන්, නන්පෑපත්, අ නේකකාන්තියටපැමිනියාවූ, කුළුගේසියෙන්, කූටා ගාරශතයෙන්ද, බිහිදෙරින්, බහිර්ද්වාරයෙන්ද, තැ න්තැන්හිදුන්, ඒඒස්ථානයෙහිදෙනලද, (හෙවත්) නගනලද, රණදෙදෙන්, හෙම්ධ්වජයෙන්ද, දුල්වූ නන්වැටුපෙන්, දල්වනලදනොයෙක්ප්‍රදීපයෙන්ද, සැදුන්ලද, සැරසුන්ලද්දාවූ, ඇගෑරුස්නෙන්, අර්ඝි කාශොභාවෙන්, සහස්රුස්දිනු, සහශ්‍රරස්මිශූර්‍ය්‍යය කලාවූ, දේනානම්වෙහෙරෙක්ද, ජේතවනනම්වි හාරයෙක්ද, සැවැත්හිපුරවරේ, ශ්‍රාවස්තිනම්පුරෙත් තමයෙහි, වෙත්හි, සමීපයෙහි, එකලවී, එසමයෙහි වූයේය

(කෙබඳුවූ ජේතවනයෙක්දයත්)

( 13 )

නන්රුක්හි කලඳුන්නදින් විලිඹුවන් සැල්වෙන්ගිගුම් (මත්බිඟුන්
පුප්සල්හි නලනුනදින් රිවුදසුන් මත්වූකෙකා පිල්බ (රුත්
විල්කොල්හි මතරුවිපැණී බටමුවන් සන්රණහසුන් රු (විස්රුත්
ඒදේනාවෙහෙරේතුරේ පසඟරුවිමෙන් නන්සවන් (ගන්දනාන්

නන්රුක්හි, (ආම්‍රපනසාදි)නොයෙක්වෘක්‍ෂයන්හි, කලඳුන්නදින්, ලෙහෙනුන්ගේගැඹිමද, විලිඹුවන්, වානරයන්ගේ, සැල්මෙන්, චලනයෙන්වූ, මත්ඪිඟුන්, මත්තභෘඞ්ගයන්ගේ, ගිගුම්, නාදද, පුල්සහි, පුෂ්පිතසාලාද්‍රැමයෙහි, රිමුදසුන්, කොකිලාවන්ගේ, නාලනුනාදින්, මිඳුමාරුතයෙන් (සෙල්වයන්නාවූ) නාදද, මත්වූ, ඹදවැඩියාවූ, පිල්බරුන්, මයූරයන්ගේ, කෙකා, කෙකාරාවයද, විල්කොල්හි තටාකතීරවල්හි, පැනි පැනට, බටමුවන්, බමුවාවූමෘගයන්ගේ, මිතුරුවි, මිතුනාරාවයද, රණහසුන්, සවර්ණහංසයන්ගේ, රුවි, හඬද, සිරුන්, රුවිසිරුන්ගේනාදද, ඒදේනාවෙහෙරේ, ඒජේතවනනම්විහාරයෙහි,තුරේ, මෘදගාදිභෙරිවගීයෙහි, පසඟ රුවිමෙන්, පඤ්චවාදකතූර්‍යයෙනාදයමෙඳ, නන්දනාන්සවන්ගත්, නානාජනයාගේ කර්ණාකර්ණයකොලේයි.

( 14 )

නන්දික්හි සරණෙන්දිනු සතැවුලිනැමෙන් නිවාමෙ (න්ගැලි
පුල්විල්හි සියපත්සහස් කරඹුමෙන් සොල්වානිසල් ප (ත්අගින්
ගන්මින්රෙන්අගරා සෙගත් හිතවරා ගත්මින්මපායි (ත්වෙසෙස්
යාගත්රුංඋවටාලෙසින් නලසවස් සව්වන්කරා ඒ වෙ (නේ

නන්දික්හි නානාදිශාවෙහි, සරණෙන්දිනු, සඤ්චාරයහේතුකොටජනිතවූ, සතැවුලි, ශරීරසන්තාපය, (හෙවත්) ඌෂ්ණගුණය, සුපුෂ්පිවිල්, සුපුෂ්පිතතටාකයෙහි, ගැලිමෙන්, නිමග්නවීමෙන්, නැමෙන්, සනානයෙන්, නිවා,නිර්වාපනයකොට හෙවත් දුහසන්සිඳුවා, සියපත්, සහස්‍රපද්මය, සහස්කරඹුමෙන්, සුවඳපිරූකරඹුවක්පරිද්දෙන්,නිසල්පත්, නිශ්චලවූපත්‍ර,

අංගින්සොල්වා, අග්‍රයෙන්වලනායකොට (මදින්මදින් හැර) රෙන්අගර පරාගනාමැතිඅග්‍රරාග, ගන්මින්, ගන්ධිමින්, සෙගන්ඝිතවර, ස්වශාත්‍රයෙහිලිම්පන යකොට, පායින්වෙසෙස්ගන්මින්ම, මණ්ඩනවිශේෂ යෙන්සැරසෙමිම්ව, සවස්නල, සාසාගන්නාමාරුතය නොම, ඒවෙනේ, ඒ (ජේත) වනයෙහි, සව්වන්කර, ශ්‍රාවකයන්කර, ඊළවටාලෙයින් ඒවිහාරයෙහිළුපස්ථා නකජනයාපරිද්දෙන්, යාගත්, යාත්‍රාවටපැමිනියා හ, (ගෙවත්)හැමී

( 15 )

නන්මල්රෙන් අගර සෙගත්ඝි තවර පූර්මල් කැනි
(ත් හිස්පුර
මීබීමත් බිඟුතන්දර සියසර පුල්වැල්වෙනින් දත්සර
කෝනානත් ලියගිනගාඅගඅගා,වාවේනසාඅත්නගා
පුල්නන්රුක් නළුකැන්රඟා දිනලඟා දේනාතිලෝ
(නෙත්දිගා

නන්මල්රෙන්අගර, (චම්පකනිපාදි) අනේකකුසුමයන්ගේ රේණු නමැති, සෙගන්ඝිතවර, ප්‍රශස්තවූශරීරයෙහිලිම්පනයකොට, පූල්මල්කැනින්, විකාසිතකුසුමස්තබකයෙන්, [හිස්පුර, මස්තකයපූරණයකොට, මීබීමත්, මධුපානයකොටමත්වූ, සියසර ශතරාවඇති, බිඟුතන්දර, භෘංග (සෙනින්) නමැති තන්ත්‍රිධාරීවූ, පූර්වැල්වෙනින්, පිපියාවූලතා (සංඛ්‍යාත) මීනාවෙන්, දත්සර, ජත්තෘසරසමින්, (හෙවත්) දසරුවසරසමින්, කෝකා, මයුරනාදනමැති, නන් ලියගිනගා, ලයාන්විතවූ අනේකප්‍රකාරගායනා කොට, අගඅගා, චඩචඩා, වාවේනා, වාතවේගයෙන්, සාඅත්නගා, ශාඛානමැතිහස්තනගාගෙන පූල්නන්රුක්, විකසිත නොයෙක්වෘක්ෂනමැති, නළුකැන්, නාටකසමූහතෙම, තිලෝනෙත්දිගා, ත්‍රෛලොක්‍ය

වාසීන්ගේනේත්‍රයට වාසයක්බඳුවූ, දේනාලඟා, ජේතවනවිහාරයටආසන්නව, රශාදීන, නෘත්‍යයක්ද ක්වූ—

( 16 )

ලඳ ලිය ලෙලප ල් ලා විල් තෙ රේ රු ක් සි ය ල්ලා
දූකැඑසිබඳලොල්ලා ගොස්තමානෙත්නොසොල්ලා
දෙතමූෘ මූ ඃපොල් ලා හො ත් නු ව න් පෑ සු නි ල්ලා
දූහැඑහිකලලොල්ලා ව න් එ ව ල් හි සි ලි ල්ලා

විල්තෙරේ, තටාකතීරයෙහි, රුක්සියල්ලා, සියළු වෘක්ෂයෙහි, ලඳ, අඟනාවවූ, ලෙල, ලීලොපේතවූ, ලියපල්ලා, ලතාපල්ලවයන්, දූකැ, අවලොකනය කොට, එහිබඳලොල්ලා, ඒ පල්ලවයෙහිකරණලඳ ලොභයකරණකොටගෙණ, තමානෙත්, තමාගේ නේත්‍ර, නොසොල්ලාගොස්, චක්ෂුඃප්‍රසාදමාත්‍රයක් දුනොකොට(සමීපයට)ගොසින්, මූවපොල්ලා, මෘග පෝතකතෙම, දෙතමූව, තමාගේමූඛය (පලලවය ට) ආසන්නකරත්ම, සූනිල්ලා, අතිසයින්නිල්වූ, නු වන්පෑගොත්, නේත්‍ර කාන්තියපල්ලවයකයනසාංකා වෙන්, එහිකලලොල්ලාදූහැ, එ (පල්ලවයෙ) හිකලා වූ ලොලත්වයදුරුකොට, එවල්හිසිලිල්ලා, ඒ ජේත වනවිහාරයෙහි (තටාක)ජලයට, වන්,ප්‍රවිෂ්ටවී—

( 17 )

දූලිනතල අසුන්වි නන්සුපුප්මල්වියන්වි
ගිනිසිළුමවූබුජ්වි කල්දූපු ප්වැල්ලියන්දුන්
පබලවිදි නිපතත්වි දම්සවන්වස් කැදීමෙන්
මහසිරගෙත නාදත්වි දම්නිවෙස් එවි එවල්වී.

පුලිනතල, වැලිකාතලනමැති, අසුන්වි, ආසන විය, නන්සුපුප්මල්වියන්වි, අනේකප්‍රකාරඋත්තිඳ්‍රාකුසුමනමැති(බඳනාලඳ)විතානවිය, ගිනිසිළුව, ලාඩිග

ලිකුසුමම, වැවුළ්වී, (දල්වනලද)ප්‍රදීපවිය, කල්, මනොඇඳුවූ, සුපුල්, සුපුෂ්පිතවූ, වැල්ලියන්දුන්, ලතානමැතිකාන්තාවන්විසින්දෙනලද්දාවූ, පබල, අභිනවපල්ලවනමැති, විදිනිපත්වී, තාලවෘන්තවිය, දම්සවන්වස්, ධර්මශ්‍රවණයපිණිස, කැඳීමෙන්, කැඳවන්නන්පරිද්දෙන්, මත, මත්වූ, සිංහනාදන්වී, කොවිලන්ගේගඬක්විය, දම්නිවෙස්එවි, ධර්මශාලාවක්පරිද්දෙන්, එවල්වී, ඒ ජේතවනාරණ්‍යයවී

( 18 )

මිනිඳුදිරිකිරිමෙන් සිව්වනක් සව් පිරිස් රැස්
තඹුරුවන දහම්රස් රැස්සියෙන් දම් හසුන් සෙල්
නැගිදිවසුරුහව්වෙන් බුත්කෙලෙස්තුල් තමස්රැස්
මුනිරජලකලේ නෙත්ගත් එදේනා සුපුල්විල්.

දම්හසුන්සෙල්නැගි, ධර්මාසනයනමැති උදයපර්වතය (සමීපයටගොසින්) ආරූඪවූ, දිවසුරුහව්වෙන්, දිවාකරලීලාවෙන්, බුත්කෙලෙස්, භග්නවූකෙලෙශ (සංඛ්‍යාත) තුල්තමස්රැස්, ඝනවූඅන්ධකාරසමූහඇති, මුනිරජ, සර්වඥරාජෝත්තමයාගේ, දහම්රස්රැස්සියෙන්, ධර්මරශ්මිනමැති රැස්ශතයෙන්, සිව්වනක්වූපිරිස්රැස්, (ආවාවූ) චතුර්වර්ණ, සිඇපිරුෂත්සමූහනාමැති, තඹුරුවන, තාමරසවනය, මිනිඳුදිරිකිරිමෙන්, විකසිතභාවයටපමුනුවමින්, (හෙවත්) සොවාන්ආදිකොරෙමින් නෙත්ගත්, (බැළැවන්ගේ) නේත්‍රාකර්ෂණයකලාවූ, එදේනාසුපුල්විල්, ඒ ජේතවනනැතිපුෂ්පිතතටාකය, ලකලේ, අලංකෘතකලේ, (හෙවත්) හෙබවී

( 19 )

ඔහුපිය-සුදසුන් මව් දේවිමායා මහාඇ
දිනිතියගබහස්නෙත් පත්එබෝසත්හු කල්මී
වැලඳිතඹුරතින්පා කල්හුමෙන් කල් වියව්සත්
පදවර කැරසිගොස් නන්දිගත් කුස්පුරදුන්.

සිහුපිය, (ශාක්‍යෝත්තරරජයාගේ) පිතෘතෙම, සුදුදු
න්, ශුද්ධෝදනනම්මහාරාජයාය, මව්, ජනනීතොමෝ,
මහාමාය, මහායත්නාආදිකොටඇති, මායා, මායාදේවි
ය, (හෙවත්) මහාමායාදේවිය, දිනිතිසගබහස්සෙනෙ
න්, මාතෘගර්භනමැතිසිංහාසනයෙහි, පත්එබෝස
ත්හු, (සර්වඥබුද්ධාංකුරවිශිෂ්ටවෙහි බෝධිසත්වයයිළත්
ට ව්‍යවහාරවෙය ඒහෙයින් පෘථුවිතලයට) පැමිනියාවූ
ඒබෝධිසත්වයන්, මීකාල්, මිහිකාන්තාතොමෝ, කල්
විසවිකල්හුමෙන්, විරත්කාලයක්පිටතවිදුවල්ලතාය
ක්හුමෙන්, තඹුරහින්, (ආශ්වර්‍ය්‍ය) පද්මනමැති (උත
ය) හසතයෙන්, පාවැලඳි, පාදමන්මය ආශෙලෂක
ලාවූ, සත්පදවරකැරැ, හසතපාදව්‍යතිහාරයකොට
(ඒබෝධිසත්වතෙම) සිගොස්, (අග්‍රොහමස්මීයනාදී
න්) සිංහනාදකොට, නන්දිගත්කුස්පුරා, ඝනාහසක්
දිශාගර්භපූරණයකොම, දිත්, දිහි—

( 20 )

පිලිවෙලිනි ලෙසෙ රැස් වෙන්වුහුත්සව්කලාවෙ න්
යස රැසි නළු විදික්සත් සරපත් සරා කා ල්
මුළුදියැ විගතුන් සිත්පා සිලිල් රැස් උදම් වි
රුපුකත නෙත සේ රැස් පැමිනින් තෝ ඇමින් වි

සත්සර, සත්වසාරයාගේ, (හෙවත්) උත්තමවූ ඒ
බෝධිසත්වයන්, සව්කලාවෙන්, සෝඩශකලාවෙන්,
(ශෝභයෙහි නොහොත්) චතුෂෂ්ටිකලාවෙන්, සියළුක
ලාවෙන්යනාර්ථයි, සරකල්පණ්, සරත්කාලප්‍රා
ප්තවූ, ලසේරැස්මෙන්, බාලචන්ද්‍රයාමෙන්, පිලිවෙල
නිවඩුත්, ක්‍රමාභිවෘද්ධිමත්වූ දිත්, සියළුදිසා, යසරැ
සින්අළවී, කීර්තිනාමැති චන්ද්‍රරශ්මියෙන් ආලෝකව
ත්විය, මුළුදියැ, සමස්තලෝකයෙහි, විගතුන්සි
ත්, විමජ්ජනයාගේසිත්නමැති, පාසිලිල්රැස්, ක්ෂීර
සාගරය, උදම්වී' උද්දමවිය, (හෙවත්)ඔදවැඩිවූයේ

ය, රැපුකාන, ශත්‍රැවනිතාවින්ගේ, නෙතසේරැස්පැ මිනින්, නෙත්‍රනාමැතිවජ්‍රකාන්තිපාෂාණයෙන් තෝ ඇම්න්වී, අශ්‍රුජලවහනයයි.

(21)

විශපැමිනි එබෝසත් සත් සරදික් සුනිල් වූ
බැමගනගත යෝනන් නෙත්හි සැව්මෙන්කුසුම් හි
සමරරුපු බලන්නෙත් දික්දිනුතේලි හව්වෙ න්
යදිදනසියො තුන්කැන්නෙත් හිමෙලෙස්නිදිස් නේ

විශපැමිනි, වියප්‍රාප්තවූ, සත්සර, සත්වසාරවූ, එ බෝසත්, ඒබෝධිසත්වයන්, දික්, දීඝවූ, සුනිල්වූ, ම නාවනිල්වූ, බැමිගනගතා (සවක්‍රවූ) භ්‍රැලතාග්‍රයන ගත්මායෝනන්, පුරවධූන්ගේ, නෙත්හි, නෙත්‍ර විෂයෑ, කුසුම්හි, අනඟයාගේ, සැව්මෙන්, (ලතා)වා පසමෙන් දිස්නෙන්, දෘෂ්‍යමානවන්නේය, සමර, යු ඩකාලයෙහි, රුපුබලන්, ශත්‍රුභටයංගේ, නෙත්, නෙත්‍රයට, දික්දිනු, දිශාවිජයකලාවූ, තේලිහව්වෙ න්, පතාකලීලාවෙන්, දිස්නේ, පෙනෙන්නේය, ය දිදනා, යාචකජනයානමැති සිනෙසාතුන්කැන්, වාත කසමූහයාගේ, (හෙවත්)වැසිලිහිනියන්ගේ, නෙත් හි, නෙත්‍රවිෂයට, මේලෙසින්, මේඝරාජවිලසයෙන්, දිස්නේ, දෘෂ්‍යමානවන්නේයි, (හෙවත්) පෙනෙන් නේයි.

( 22 )

ඉසොවුරු ලියවන්වූ ඒකළුන්සිත් සතොස් වා
ඒවිරු එකුනතිස්වස් දෙව්නාළන් වන්නළන් හා
සමග විදසිරිනන් පුත්රුවන් ඒකළුන් හා
දහතු රඟ අරසත් සෙත්හි සිත්ලා මයා ග ත්

ඒවිරු, ඒවීරපූජිතෙම, ලියවන්වූ, (සවර්ණ) ලතා වක්, වැනිවූ, ඉසොවුරු, යසොධරණම්වූ, එකළුන්, ඒකාන්තාවන්, සිත්සතොස්වා, චිත්තසන්තොෂකා

රවා. (ගෙවත්) ප්‍රතිග්‍රහණයකොට එකූනතිස්වස්, එකුන්තිස්අවුරුද්දක් ඉක්මුත්ලෙහි. දෙව්නලන්වන් නලන්හාසමග, දිව්‍යනාටිකාවන් හාසමානවූනාටක යන්හාසමග, නන්සිරිවිඳ, නොයෙක්ඓශ්වර්‍ය්‍යානුභ වකොට, පුත්රුවන්, රාහුලනම්පුත්‍රරත්නයද, ඒක එන්හා, ඒබිම්බාදේවියද, දහ, හැර, සත්සෙත්හිම, ලොකාර්ථයෙහිම සිත්ලා සිත්බඟා, තුරඟඅර, කන් ථකනම්, අසවාරූඪව, සාගත්, ගෘහාභිනිෂ්ක්‍රමනය කලේ—

( 23 )

බෝසත්හි තෙරපත් වැටුප් හිනැයිදුව්වන් කෙස්
(ගුවන්හි දම

සිව්වත් දුන් එකසාව තින් ගෙනෙත වූස් වෙස්ගම්
(නියම් ගම්හිදු

බික්ගැම් මෙන් දෙනෙ සෙත්කෙරේ මිනාදෙදේ
(සෙත් දුන්තනිස් මින් නිපන්

අස්නේ බෝතුර මූල්හි උන්නෙ සුරරුක් මූල්හි සඟ
(ස්නෙත්ගු මෙන්

නිතෙරපත්, අනෝමානම්,* ගංගාතීර ප්‍රාප්තව, බෝසත්, ඒබොධිසත්වතෙම, වැටුප්හිනැගිදුන්වන්, ප්‍රදීපයෙහිනැංගාවූධූමරාජියක් පරිදෙදන්, කෙස්, ඛඩ්ගයෙන්කැපූ' කේසධාතුව, ගුවන්හිදම, ආකාසයෙහිහැර, සිව්වත්, මහාබ්‍රහ්මයාවිසින්, දුන් ඒකසාවතින්, දෙනලද්දවූ ඒ අෂ්ටපරිස්කාරයෙන්, (කාසාවසත්‍රයෙන්යනාර්ථයි) ගෙණතවූස්වෙස්, තාපසවේසධාරීව, ගම්නියම්ගම්හිදු, ග්‍රාමනිගමරාජධානියෙහි, බික්ගැම්මෙන්, භික්ෂාටනයකිරීමෙන්, දෙනෙසෙත්කෙරේමින්. ලොකාභිවෘද්ධිකරෙමින්, දෙදේසෙත්දුන්, ස්වාන්තිබ්‍රාහ්මනයාවිසින්දෙනලද්දවූ; තනිස්මින් නිපත්, කුසතෘනාඉසඑයින් නැං

ගාවූ, බෝතුරමුල්හි, බෝධිද්‍රැමමූලසමීපයෙහි (නැං ගාවූ) අස්නේ, විජ්‍රාසනයෙහි. සුරරුක්මුල්හි, මන් දරවෘක්‍ෂමූලසමීපයෙහි, සහස්නෙත්හුමෙන්, ශක්‍ර දිව්‍යරාජයා පරිද්දෙන්, උන්නේ, හුන්නේයි.

( 24 )

බෝමුල්හි සමතිස් පෙරුම් හැමපුරා ලද්දෙන් මෙමා (බන් පලක්
හුනාවි මම් සවුනේ ගෙවා දැනනාමුත් හුන්කල්එදා (ට මහත්
දැන් දුන් ඒසිදුහත් නිකුත් ගවජයින් දැන්යානොදී (ගොස් වහා
උඟන්වය් මරදෙව් කියම් නිදවගත් මේයන්නාමින් (යෝ බලන්

හැමසමතිස්පෙරුම්පුරා, සියළුසමතිංශත්පාරමිතා වන්පූරණයකොට, බෝමුල්හි, බෝධිද්‍රැමමූලයෙහි, ලද්දෙන්, ලද්දාවූ, මෙමාබන්පලක්, මාවිසින්බැඳනාලද්පය්‍යඞ්කය, සවිනේගෙවාදැනනාමුත්, සියළුක්‍ෂෙත්‍රයමණ්ඩලයපාරප්‍රාප්තවූබුද්ධ ඥානයෙන්දැනනාමුත්, හුනම්මම්, නොවීනම්මම, ඒමහත්, ඒමහෝත්තමයා, එදා, එදවස, හුන්කල්, වැඩහුන්කල, පසින්, (මාගේ) පාසයෙන්, දැන්නිකුත්, ඇසිල්ලකින්නිස්ක්‍රාන්තව, දැන්වහාගොස්, දැන්දුහුව ගොසින්සිදුහත්, සිද්ධාර්ථකුමාරයා, දැන්යානොදී, දැන්පලායානොදී, උඟන්වය් ඒසිද්ධාර්ථකුමාරයා; අල්වාගන්වයි, මරදෙව්, (වසවර්ත්ති) මාරදේවතෙම, කියම්නි, (මෙලෙස) කියමින්, යෝබලන්, (අපරිමිතවූ) යෝධභටයන්, මේයන්නාමින්, යුද්ධාභිමුඛ කොරෙවින්, දව්ගත්, ධාවනයකොලේයි.

( 25 )

බෝමුල්හි වරසුන් අරබුදු වෙමින් හුන්නේද පස්කා
(ම්වර
ඌගන්වය් කිඹිමින් එමින්ව පෙනෙ මින්පාවින්අවි
(න් වෙස් දහස්
එල්වා හිස්සැවරූසියන් උරපලා උප්ලාපියා ආබ ලෝ
දක්මින් ඒ විරූනන් දිගත් හිඳවිගත් ශිම්රැස් තිමිස්
(රැස්හුමෙන්

බෝමුල්හි. බෝධිද්‍රැමමූලයෙහි, වරහුන්අර, වජ්‍රාසනාරූඪව, පස්කාම්වර. පංචකාමවර්ජිතකොට, බුදුවෙමින්හුන්නේද, බුද්ධත්වයසිද්ධකෙරෙමින්හුන්නාහුද. ඌගන්වයුක්කිඹිමින්, එසඬාණීකුමාරයාඅද්වාගන්වයිකියා, එමින්, ධාවනයකෙරමින්, පෙනෙමින්, (ආකාශය) උඩටනැගිමින්, අමින්වෙස්දහස්, අපරිමිතවූ (භයානක) වෙෂසහශ්‍රයන්, පාවින් දක්වමින්, සැවරූසියන්, මෘතරූපශතයන්, උරපලා, උරයෙහිපැලඳගෙණ, උප්ලාපියා ඉස්එල්වාපියා, (දෙපයගෙණ හුවමහස්පොවයකො:ට) ආබලෝ, අවාවූශෝබහටයෝ, එවිරූදක්මින්, එවීරපූ ... බලමින්, ශිම්රැස්, සූර්‍යරස්මීන්ව, තමි... රැස්හුමෙන්, අන්ධකාරසමූහයෝමෙන්, ... න්දිග ... න්හි, ඒ ඒදිශාන්තයට, දවගත්, ධාවන ... නලේ

( 26 )

දූල්වූවත් අඩිවින් නිකුත් නලකදින් පෑනන් දිගත්
(පත් දූගත්
ලේඋරා දෙක පොල්පුර විදසර නන්දික් පූරවෙස්
(දර
ගොස් දෙස් බස් නොස රස්කියා එව්ගසා රෙස්මින්
(සරෙස්බස් කියා
ඩන් වන් සෙන් කල මින් මතැත් හුනලරන් හවියෙ
(න්මබුන් නෝ එසත්

දල්වූ විවෘතකරණලද, වත්අවටින්, මුඛාවාට යෙන්, නිකුත්නලකදින්, නිෂ්ක්‍රාන්තවූවහ්නිස්ක න්ධයෙන්, යුගත්පත්, යුගාන්තකාලයටපැමිණි, නන්දිගත්පෑ, නොයෙක්දිගාන්තරයදක්වා, දෙක පොල්පුර, උභයකපොලයපූරණයකොට, ලේඋරා, රුධිරපානයකොට, නන්දික්පුරා, නානාදිගාන්ත රයපූර්ණකොට, විදසරා, ශරවිද, වෙස්දරා, (භයා නක) වේෂධාරීව නොසරස්ගොස්, වහාගොසින්, එවිගසා, එක්ෂණයෙහි, දෙස්බස්කියා, (බෝමැඩ අපිසන්තකයයියනාදීන්) සාක්ෂිබස්කියමින්, රොස් මින්, රෝෂවෙමින්, සරොස්බස්නියා, රෝෂසහිතව බෙනෙමින්, වන්වන්සෙන්; ආ ආ (මාර) සේනාව, කලමන්, කලාවූඅභිමානය, මතැත්හු, මත්තහස්ති යක්හු, නලරන්ගවිගෙන්ම, රණහුනවනලීලායෙ න්ම, එසත්, ඒබොධිසත්වතෙම, බුන්නේ, හග් නකෙලේසි—

( 27 )

පානානන්විකරන්ර තැස් නිසසරන් රොන්වන්අව (ග්හිදිළු
දල්වාලා වනකස්තරුස් සිහවගුන් ඇරෑ දහස් දක් (වමින්
වේලෝකුස් පුරමින්මහත් සැඩහඩින් වස්මින්නිව (ස්මෙදහස්
රොස්මින් ඇරුපූණෙන් වැමුප්ගි පලගුන් මෙන්වන් (හබෝසත් තොදෙය්

නන්විකරන්පානා, අනේකවිකාරදක්වන්නාවූ, නිසසරන්, නිසාචරයන්ගේ, අවග්හිදිළු, අපාය ගන්ණ යෙහිදිලිගෙන්නාවූ, රොන්වන්, ගිනිපුපුරුප රිදෙදන්, රත්, රත්වූ, ඇස්දල්වා, නේත්‍රාන්විල නයකොට, වනකස්, වානරයෝය, තරුස්, වල

ස්හුය, සිහ, සිංහයෝය, වගුන්, චිත්‍රයෝග, ඇරූද
හස්දක්වමින්, මේආදි (භයානක) රූපසිහශ්‍රෘන්ද
ක්වමින්, මහත්සැඩහඬින්, මහත්වූවඹනාදයෙන්,
ලෝකුස්ප්‍රරමින් (සිඤළි) ලෝකුහරපූර්ණයකර
මින් නිමස්මේදහස්වස්වමින්, පාශානමේඝසහශ්‍ර
යන්වර්ෂණයකරමින්, රෞස්මින්ආරූප්‍රසෙන්, රෞස
වෙමින්ආවාවූමාරසේනාව, වැටුප්හිපලහුන්මෙන්,
ප්‍රදීපයෙහි පතඞ්ගයන්මෙන්, බෝසත්තෙදෙය්,
බෝධිසත්වයන්ගේතේජස්හි වන්, වන්නාහුයි—

( 28 )

තෙව්නාදත් සූවලින් ඒදෙව්මය සවන් බොල්වූමෙ
(දෙන් තෙත් කොපොල්
ඒදෙව් කෝඅගදුන් රුසක් සෙළුමහත් ඒඇත්හුවේ
(යාවහා
ඒකල්දෙව්රණ මේනිපන් සෙනවිලස් සක්සැත්ගැසී
(ගොස් මැසී
ඒගොස් පාබිඹුවන් බිදෙත් එමරදෙව් එක්සත්කෙ
(ලේ දම්රජ

ඒදෙව්මයසවන්, ඒමාරදිව්‍යපුත්‍රයාගේ කිතිතියප
රිදෙදන්ධවලවූ, දත්සුවලින්තෙව්නා, දලසගලින්
හොබනාවූ, බොල්වූමෙදෙන්, ඝනවූමිදජලයකින්,
තෙත්කොපොල්, ආද්‍රවූකපොලඵලඇති, ඒදෙව්,
ඒමාරයාගේම, කෝඅගදුන්රුසක්සේ, කෝපාග
ණිධූමරාසියක්මෙන්, එමහත්ධූමවර්ණයෙන්, ම
හත්වූ, ඒඇත්හු (ඒ ගිරිමෙඛලානම්) හස්තිහු, ව
හාමේයා, සීඝ්‍රයෙන්යුඬාභිමුඛකොරෙමින්, එකල්, ඒ
කාලයෙහි, ඒදෙව්, ඒවසවර්තීමාරයාගේ, රණමේ
නිපන්, යුඬනාවැතිමේඝයෙන්ජනිතවූ, සෙනවිල
ස්, අශනිවිලාසයටබදුවූ, සක්සැත්, චක්‍රායුධය

ගැසිගොස්වැසි, සාහසිකාවගොසින් දමීන, ඒහෙයින් ඒ (චක්‍රායුධාවිප්‍රාසනයෙ ...) ගොසින්, පාබිසිවන්, පාදාජනයක්මෙන්විජනේ, එවරදෙව්, ඒමාරදි ව්‍යපුත්‍රයා, බිංදත්, (යුඩයෙන්) පරාජයවත්ම, දම්ර ජා, ධර්මරාජවූඒබෝධිසත්වතෙම, එක්ඡත්කොටේ, ඒකාතපත්‍රකොටේයි.

( 29 )

සොල්වා සෙල්සහවල් තුඹුල් මුළුපුටා සල්සෙල් විසල්
(ඉස්වටා
පාණේ පාදපුලම් ගෙණේ මහනතා පාණේ දුබාණි
(දුසේ
සෑසිගොස් නොසරස් සරෙස්ව බැනබස් දුස්වෙස්
(පිසස්රැස්එවන්
මන් සුන් සුන් කොලෙසුන් පසුන් කෙලෙදසුන්තුන්
ලෝතමා ලෝතු මා)

සහවල්, ආරණ්‍යසහිතවූ, සෙල්සොල්වා, පර්වත වලනයකොටගෙණ තුඹුල්මුළුපුටා, මහත්මුලෝ ත්පාටනයකොට, මහන (මහ) ශ්‍රමනය, පාද, පා දයෙන් තාගෙණේ කාඅල්වාගණ, පාණේ, පාෂා ණයෙක්හි, (ගසන) දුබාණිදුසේ, කිළුමුකාඩත්ප රිදෙදන්, දෘණේ, (සක්වල) ගලෙහි, අපුලම්, අෂ් ෂොටනයකාරම් (හය්) නොසරස්, වහා, සෑසිගොස්, සාහසිකාවිගොස්, රෙස්වබැනබස්, රෝෂවබස්බෙ නෙමින්න්, දුස්වෙස්පිසැස්රැස්, නපුරුවේෂධාරිවූ ඒ රාක්ෂරාසියගේ, මන්සුන්සුන්කලේ, මානයවූන්හා විචූර්ණකලාවූ, පසුන්කෙලෙසුන්, ප්‍රසූනයකෙලෙස යන්ඇති, ලෝතුමා, ලෝකෝත්තමවතෙම, තුන් ලෝ, ත්‍රෛලෝකයවාසින්, තමාදසුන්කලේ, තම න්වහන්සේට දාසවකෙලෙයි.

( 30 )

සිඟුනෙදිනි පුලුන් රල්වා වෙයින් මෙන් තමාසෙන්
පලතඑගිරි මෙව්ලා වෙව්ල වෙව්ලා එවල් ගි
නොදිස උපදෙසක් අන්පස් කමින් ඌදනම්ග ය්
එසඳ සඳවතුන් වෙත් ගොස් මෙලෙස්වී එදෙවිපු ත්

සිඟුනෙදිනි, සර්වඥයන්වහන්සේගේතේජසින්, වාවෙයින්පුලුන්රල්මෙන්, මාරුතවේගයෙන්සිඹුල් පුලුන්රලක්මෙන්, තමාසෙන්, තමාගෙසේනාවද, එගිරිමෙව්ලා, ඒගිරිමෙඛලානම්හස්තිහුද, වෙව්ල වෙව්ලා, (සිතින්) කම්පාකම්පාව, එවල්හිපලත, ඒ සමීපවලට පලාගියේය, අන්උපදෙසක්නොදිස, අ න්‍යඋපදේශයක්නොදක, පස්කමින්, පශ්චාත්වයෙ න්, ඌදනම්ගය්, ඒසර්වඥයාපරාජයකරම්හය්, ඒ දෙව්පුත්, ඒමාරදිව්‍යපුත්‍රතෙම, එසඳ, එසමයෙහි, සඳවතුන්වෙත්ගොස්, චන්ද්‍රයාටබඳුවුමුවඇති, (ත මාගේ) දුන්සමීපයටගොසින්, මෙලෙස්වී, මෙ සේකී

( 31 )

අසමින පනුවන්හි පාරලත් කල් තබා ලා
සවනා සවනා තෙප් ලෙක්විද ඒයේද අන් තැ න්
ඉතිබැනා ගෙණ දෙව්දුරන් ලියන්මෙන් දැගුන්ගත්
සලෙළු මතගජන්පාළු ඇකිල්ලේ විලස් ග ත්

අසමින්, (ඒමාරපුත්‍රකීබස්) ශ්‍රවනයකෙරෙමින්, අ පනුවන්හි, පාරලත්කල්තබාලා, අපගේනෙත්‍රනා මැතිශූරප්‍රහාරලත්සමයෙහ.ර (හෙවත්) අපදුටුවා වූකාලයතබා, සවනා, ශ්‍රවනයෙහි, සවනාතෙ ලෙ ක්විද, ශ්‍රවණියවූවචනයක්ඇද්ද, (හෙවත්අප ගේ, බස්ඇසිද, අන්තැන්ඒයෙද, (අපගෑර) අන්‍ය ස්ථානයකටඒපුෂියායෙදැයි ඉතිබැනාගෙණ, මෙලෙ සකියාගෙණ, ගිය, (සර්වඥන්සමීපයට) ගියාවූ,

දෙවිදු, මාරවධූහු, (කෙසේද) දූගුන්ගත්රන්ලිය න්මෙන්, ජඞමවූසුවර්ණලතාවන්පරිද්දෙන්, සලෙ ළුවතඟනන්ට, සල්ලාලජනයන්නමැතිමත්තහස් තීන්ගේපාදයෙහි, ඇඟැකිල්ලේවිසල්ගත්, ඇවාවූ ශෘඞ්ඛලාදාමයෙක්හිලීලායෙන් (පැහැර) ගත්තා හුයි

( 32 )

කොඳ වැල දසනින් හා පුල් පියුම්වත් සිරින් හා
පළු ලෙල රතතින් හා පිල් සඳූස්නිල් කෙසින් හා
බිඹුවැලඋවනින් හා හෙම්හසුන් පුන් තෙනෙන් හා
කනරඹව ටොරින් හා ගත් කළුන් මන්වතින් හා

කොඳවැල, කුඳ (කුඩමල) ශ්‍රේණීන්ටබඳුවූ, දසනින්හා, දන්තමරීචියෙන්ද, පුල්පියුම්, පුල්ලපද්මයන්ටබඳුවූ, වත්සිරින්හා, මුඛශොභාවෙන්ද, ලෙලපළු, ලීලෝපේතපල්ලවයන්ටබඳුවූ, රතතින්හා රක්තහස්තතලයෙන්ද, සඳූස්පිල්, චන්ද්‍රපිඡකලාපයටබඳුවූ, කෙසින්හා, කෙශකලාපයෙන්ද, බිඹුවැල, බිඹුවැලටබඳුවූ, උවනින්හා, රක්තාධරයෙන්ද, හෙම්හසුන්, ස්වර්ණහංසයන්ටබඳුවූ, පුන්තෙනෙන් හා, පීනපයොධරයෙන්ද, කනරඹ, හෙමකදලිස්ඛන්ධයන්ටබඳුවූ, වටොරින්හා, වෘත්තවූඌරුයුග්මයෙන්ද, කළුන්වන්, වලාහකයන්ගේසිත්ගත්, (තමන්ගේරූපවිලාසනමැති මතින්පැහැර) ගත්තාවූ (මාරස්ත්‍රීහුයි

( 33 )

එමර රුපු සුගත්වත් පුල්කමල්හි සුනිල් නෙ ත්
බිහුවැලහැර නෙත් කල්රූ විලස් තෝනිදම් හී
පබල ලිය කුරෙක්හි කෝමලින් පත් විලස් පෑ
අදවරණ සඳ මේ විහුදිස් නෙනන් දසන් හී

එමරරුපු, අමාරශත්‍රැහු සුගත්, සර්වඥයන්ගේ, වත්පුල්කමල්හි, විකසිතවූ, වක්ත්‍රපද්මයෙහි, සුනිල්, මනානිල්වූ, නෙත්බිගුවැලගැර, නෙත්‍රනමැති භෘඞ්ගශ්‍රේණින්විදහා, නෙත්කල් (ලෝකයාගේ) නෙත්‍රයටමනොඳවූ, රුවිලස්තෝනිදර්ශ, (අමාර කාන්‍යවන්තමන්ගේ) රූපවිලාසනමැතිසාගරයෙහි, පබලලියකුරෙක්හි, ප්‍රවාලලතාඞ්කුරයෙක්හි, නේවලින්පත්, පෙනයකින්පැමිනියාවූ විලස්පෑ ලීලාවක්දක්වා, දසන්හිදිස්නෙන්, දන්තමරීචින්, දදවරණසඳ, අදරපල්ලවසරසමින්, මේවිහු, මතුකියනාක්‍රමකීහු—

( 34 )

තරවිදු කලඹෙව්මේ ගබ්හි තෙවුනා මෙනා ද න්
හිඳවිදි සිරිකින්දු කල්විනා වුන් මෙරුක් මු ල්
පබව තවිතදක්නා වස්නොයෙක් වෙස් දූරූ බැ වි
දිශ දෙස බිලියන්දු යාඳසුන් යාදසුන්ව ත්

මේගබ්හිතෙව්නා, මේඝගර්භයෙහිහොබනාවූ, තරවිදුකලඹෙව්, සපිරවපවත්නාවූවිදුලිකලාපයක් මෙන්, කල්විනාවුන්, කාන්තාවන්හැර, මෙරුක් මූල්, මේ(බෝධි) ද්‍රැමමූලයෙහි, හිඳවිදි, නිසඳදාව අනුභවකලාවූ, සිරිකින්දු, (තොපගේ) කවරහෙ ඓශ්වර්‍ය්‍යයෙක්ද, ඒකදඅයිශ්වර්‍ය්‍යයක්අපට පෙනෙන්නේදනැතබලඑකෙක්ඇත) පබවතවතදක්නාවස්, ප්‍රජාවතියගේමූවයදර්ශණයපිනිස, නොයෙක්වෙස් දූරූබැව්, (මාලාකාරාදි, නොයෙක්වෙෂධාරිබව, දියදෙස, සකලලොකයාමසාක්ෂිය, යාඳසුන්, ප්‍රියදර්ශණඇතිවනිතාවන්ගේ, යාදසුන්වත්, සන්දර්ශණයපිනිස, බිලියන්දු, බලිකර්මාන්තයෙක්ද, (තොපනාරන්නේය) (හෙවත්) මන්ත්‍රදර්ශනයෙක්ද—

(වැලිදූ මාරවධූ හුමෙනෙකියත්—කොසේදත්)

( 35 )

සිදුහත සිදුහත්හිවත් නොදිස්නෙය් නොදිස්නෙ ය්
නෙනෙ තුල මෙමහත් දුක් මානුවන් තෝලොබින්වූ
පළුපුල සියපත්අෑ වත්ත අත් නෙත් උවන් අෑ
කැරැ අතල ගලෙක්ලා තාමැවූ:වන් ඒසිවි ව ත්

සිදුහත, සිද්ධාර්ථකුමාරයෙනි සිදුහත්හි, සර්වඥ ර්භායෙක්හි, නොදිස්නෙය, (නෙපි) දූරස්තරවතු බුවසතුවත්දකුම්හ, මෙනෙතුල, ලෙහිතුල, (නො සැහෙනනෙහයින්ඉතිරයියාවූ) මානුවන්තෝලොබින් වූ, තොපගෙලෝභසෙන්වූමාගෙනේත්‍රයෙන්, බා ෂ්පවහනයෙන්වූ) මෙමහත්දුක්, මේවහත්දුඃඛය, නොදිස්නෙය, (තෙපිඥසන්නවත්) නොදකුවද, (ලවඞකුත්තොපයන්තානයෙහි නැතදළුහෙයින්) පළුපල්ලවය, උපුල, උත්පලය, සියපත්අෑ, ශතප ත්‍රාදිය, අත්, හස්තය, නෙත්, නේත්‍රය, වත්, මු ඛය, උවන්අෑ, වක්ත්‍රාදිශරීරාවයවය, කැරැ, (නිර්මා ණය) කොට, එසිවිවත්, මහාබ්‍රහ්මයා, ත, තාගෙ, (හෘදයෙහි) අතලගලෙක්ලා, පැතුරුණාවූගලක් බහා, තාමැව්වූවන්, තානිෂ්පන්නකලේවන්, (ඒහෙ යින්වේද) මෙලෙසවත්ද: තවදමාරාඞ්ගනාවෝඅ ඞ්ග චේෂ්ටායුදුසුසැවි සම්ප්‍රාප්තකාලයක් කියත්.

( 36 )

ම ල්හි ම ල්හි බිඟුතුඩගලී සල්හිවල්හි විසල් වූ
නි ල්හි නිල්හි සිසි කතදිලි යෙල්හි මුල්හිගඟුල් වී
පූ ල්හි වි ල්හි වැද නාලඹලේසෙල්හි සෙල්හිකොකාවි
ම ල්හි ම ල්හි තමසැරනලා කල්හි කල්හිම වෙද් දා

විසල්වූ, මහත්වූ සල්හිවල්හී, සාලාද්‍රුමවනයෙහි, මල්හිමල්හී, කුසුමයක්කුසුමයක්පාසා, බිඟුතුඩග ලී, භෘඞ්ගශෝතමාගේවඩිවාශ්‍රබැහුහ, නිල්හිනිල්

හි. (අතිරම්‍යව) නිර්වූආරණ්‍යයෙහි, සිසිකතාදීප්ති, ච
න්ද්‍රකාන්තිදීප්තිමත්විය, සෙල්හිමුල්හි, පර්වතමූලයෙ
හි, ගලුල්වී, නිර්ඣරයෙක්විය, පුල්හිවිල්හි,(අනේක
කුසුමයෙන්) සුප්‍රස්ඵිතවූපුෂ්කර නියෙහි; වැද, ප්‍රබ
ෂ්ටව, (ගඳවිලවූන්නෙගන) නාලඹලේ, මන්දමාරුත
හමින්නටවන, සෙල්හිසෙල්හි, පර්වතයක්-එත
යක්පස, කෙකාවී, මධුරනාදත්විය, (මෙම්අවකා
ශයෙහි) මල්හි. අනඛගයා, මල්හි, කුසුම්බානය,
තම, තමාගේ, සැරනලා, ලතාවාපයෙහිබඟා, (සන්
නාඩකරණ්ණෙය, මෙසේවූවිරහකාලයෙහි) කල්හි,
සත්‍රීන්විෂයෙහි, කල්හීම, කල්ම, වෙද්ද, උමනාවෙ
ද්ද

( 37 )

මනහර රසහවිනෙන් රුවිලස් නන් ලෙසින් පෑ
තෙපලත ඉතිදෙවිඳු ඒගෙ සුන් ගොත් මහත් මා
සරණසිරි සැදෑපෑ පත්සරනී කලා නි
කොලමුහුළු සුපුල්වූ වත්පියුම් ඒකළුං ගේ

මනහර, මනොඥවූ, රසහවිනෙන්, ශෘංගාරරස
භාවයෙන්, (යුක්තවූ) රුවිලස්, රූපවිලාසයෙන්,
නන්ලෙසින්පෑ, (තරුණධෛර්‍යමාදී) අනේකප්‍රකා
රවේසදක්වා, දෙවිඳු, (ඒ) මාරදූන්, ඉතිතෙපලත,
යථොක්තප්‍රකාරයෙන්යාඥකොටකිවද, ඒ ගොතු
න්ගොත්මහත්මා, ඒ ගෞතමගෝත්‍රයෙහිඋපන් ම
හත්වූ, (සර්වඥරජ) හුගේ. සිරිසරණ, ශ්‍රීපාදතලන
මැති, සැදෑපෑපත්, සන්ධ්‍යාකාන්තියටපැමිනියාවූ,
සර, සෝභාසහිතවූ, නී, නඛශ්‍රෙණීන්නමැති, කලා
නි, අභිනවචන්ද්‍රතෙමේ, ඒකළුංගේ, ඒමාරස්ත්‍රීන්ගේ,
සුපුල්වූවත්පියුම්, මනාවප්‍රබුඬවූමුඛතාමරසයන් මුහු
ළුකොලේ, මුහුලිතවූ,වාක්කොලේ, (හෙවත්) හැකි
ලිමකොලේ

( 38 )

දසනු දෙසරුපුන්කැන් මේඝලසින් මෙලෙසින්යත්
විමලඹ ර කලාණි වෙන් ගහන් කැන් සහස් නෙන්
සැනකෙලිකෙලනාවුන්නන් දෙසින්නන්වෙසින්ද
අසුර සුර දගස් නෙන් ඒතිලෝ නා.බි ජිලෙ වි

රුදුන්කැන් (මාර) ශත්‍රුසමූහයා, දසනුදෙස, දිශානුදිසාවෙහි, මේලෙසින්, උක්තක්‍රමයෙන්, මේ ලෙසින්, මේඝවිලාසයෙන්, යත්, යන්නේයි, විම ලඹර, පරිශුද්ධාවකාශයෙහි, ගහන්කැන් තාර කාසමූහයා, (පිරිවරණලද්දවූ) කලාණිවෙන්, ච න්ද්‍රපරිදෙදන්, සැනකෙලිකෙලනාවුන්, උත්සව ක්‍රීඩාකරන්නාවූ, නන්දෙසින්, ඒ ඒ දිශාවෙන්, නා නා වෙසින්ද, අනේකවේෂයෙන්ආවාවූ, අසුරසුරසඟ ස්නෙනන්, දිව්‍යාසුරසඟයන් කාරණකොටගෙණ, ඒතිලෝනා, ඒත්‍රෛලෝක්‍යස්වාමීවූභාගවතතෙම, ලෙ විබිජී, ලෝකයෙහිබැබී, ශොභත්‍රාජිතවී

( 39 )

නන්දිග් යත් මුරුරැස් අලෙව් රජගහා ආලෙවි ම
(ගත් නන් පුරේ
නන් නැන් දින්හිනිකුත් මහත් යසතෙදූත් මී පල්හු
(වෙන් නැන් රුපුන්
බුන් මින් දින් ඊඅලවි නැලා ගිර අඟුල්මල් ඇරුපු
(න් රැස් මගත්
සිවි සස් වත් දෙස මින් දනා හටවසත් සවිනේ ගෙ
(වා දත් සුගත්

අඹුරුරැස් උත්සවපූජාව පිණිසආවාවූ දිව්‍යසමූහ යා, නැන්දිගත්යත්, (පූජාවසානයෙහි) ඒ ඒ දිගට ගී ෂාත්‍රකල්හි අලෙව්රජගහා, අලව්රජගහරටආදීවූ, ලෙව්මහත්, ලෝකයෙහි ප්‍රශස්තවූ, නන්පුරේ,

නානාරාජධානියෙහි, නන්දික්හි නානාදිසායෙහි නික්මුත්, නිස්ක්‍රාන්තවූ, මහත්ගසනෙද්‍රත් මහත් වූ ශ්‍රීතීර්තිගතතේජස්ඇති, නන්රජුන්, නානාශත්‍රැන් මීපල්හුමෙන්, චක්‍රවර්තීරාජශුරිදෙදන් ඒ අලව්, අලංකාය, නාලාගිරි. නාලාගිරිය, අඟුල්ම ල්අෑ, අඟුලිමාලාදී, මහත්, (මේ) මහත්වූ, රැපුන් රැස්, ශත්‍රුසමූහයාගේ, මන්බුන්මින්, දමනගන කෙරෙමින්, දනාහට, ලෝකයාහට, සිරිසස්වත්දෙ සමින්, දුඃඛසමුදයනිරෝධමාර්ගීය, යනාවතුරාර්‍යස ත්‍යනාමැතිවසතුදේසනාකරමින්, සර්වඥෙභාවාදත්, සියළුක්ලේශයසමඩලයපාර ප්‍රාප්තවදත්නාවූ, සුගත්, (ඒ) සර්වඥයන්වහන්සේ, වසත් වාසයකාරණකල්හි.

( 40 )

ඒ සව්ඤෙ ගෙවමින් දහම් ලොවුතුර දම්හය් සතන් ( හිනැතත්
නන්දි ත් හි කියමින් දනා සගණමින් ගන් මින් අම් (න් වෙස් දහස්
රැස්වූ තිත් වග බස් අසා නොඉවසා මීපල් කො (ගොල් ගොස් සකුස්
දේනා නම් වෙහෙරේ සුගත්හට මෙව් පාමුත් මුදුන් ( මල්කොවින්

ඒසව්ඤෙගෙවමින්ලොව්තුරදහම්දම්හය්, ඒ සක ලක්ලේශයසමඩලයගෙවමින්, ලෝකෝත්තරධර්මය, (අපි) දහම්හය්, සතන්හි, (ලෝකෝත්තරධර්මය ක්තමන්ගේ) සන්තානයෙහි, නැතත්, අවිද්‍යමා නාවුවත්, නන්දික්හිකියමින් (බුදුබවහභවා) ඒඒ දික්හිප්‍රකාසකෙරෙමින්, දනාසගණමින්, මුග්ධ ලෝකයාඅනේකාවචනයෙන්සිත්ගනිමින්, ගන්මි න්අමින්වෙස්දහස්, අපරිමිතවූවේෂගහනාකෙ රෙමින්, රැස්වූ, රාසිභූතවූ, තිත්වග, තීර්ථකසමූ

හයාගේ, බස්අසා, (යථොක්තප්‍රකාර)වචනඅසමින්, නොඉවසා, ක්‍ෂමාකොටගතනොහී, කොසොල්මීපල්, කෝශලරාජතෙමෙ, සතුස්ගොස්, සීඝ්‍රවගොසින්, දෙනානාම්වෙහෙර්, ජේතවනනාම්විහාරයෙහි (වැඩහුන්නාවූ) සුගත්හට, සර්වඥයන්වහන්සේට, පාමුත් මුදුන්මල්කොටින්, (සර්වඥයන්වහන්සේගේ) ශ්‍රීපාද මිසැත කාවතංසයක් කොට, (හෙවත්) ශ්‍රීපාදසවැද මෙවී, මෙසේකීසේක, (තීර්ථකයන්කී බසදූන්වූ සේසා සනුයි) ඒක්වාවූබසසා—

( 41 )

මේතුන් ලෝනරඹා මගත් විනොදනා දක්මින් ඉවූ
(න් සෙත් නිසා
සත් සෙත් සිත් එවියත් සුගත් ගඹඹ රුක් මුල්හී
(සැ වත් හී එක ල්
දක්වම් වය් තොපලී යමා පෙල හරක් ඒබස් එති ත්
( රැ ස් අ සා
කාප්වා නන් අඹරුක් මුලින්ව උපුටා දුම්මී සැවත්
(හී ව හා

මේතුන්ලෝනරඹා, මේ තෙලොකය නිරීක්‍ෂාකොට, මහත්විනොදනා, බොහෝවූවෛනේජනයා, දක්මින්, බුඩඥනයෙන්දකිමින් ඉවුන්සෙත් නිසා, ලෝකයාහටපාරලෞකිකාර්ථපිනිස, සත් සෙත්සිත්, ලෝකාභිවෘඩියෙහිසිත්ඇති, එවිසත්, ඒවහජතවූ; සුගත්, ධර්මරාජතෙමෙ, එකල්, එසමයෙහි, සැවත්හී. ශ්‍රාවස්තියෙහි, ගඹඹරුක්මුල්හී; ගණ්ඩනම්වෘක්‍ෂමූලයෙහිදී, යමාපෙලහරක්, යමකප්‍රාතිහාර්යයෙක්, දක්වම්හය්, ප්‍රකාශකරම්හයි, තොපලී, වදලසේක, ( එලෙසවදල ) බස්, තෙපුල්, එතිත්රැස්අසා, ඒති තීර්ථක සමූහයා ශ්‍රවනයකොට, සැවත්හි, ශ්‍රාවස්තියෙහි, මූලින්මඋපුටා, මූලො

ත්පාටනයකොට, නන්අඹරැක්කප්ා හොයෙන් ආම්‍රදෘමඡෙදනායකරවා, වහාදූම්මි, (ප්‍රාතිහාර්‍ය්‍යකාර්නාටපලඹුංකොට) ප්‍රභුවනැතිකෙලේසි—

( 42 )

නන්වාගොස් මඩුවත්සඳ ඉඳුවරින් සෑසීමවා සිතිය
දක්වම් හය් කියමින් අපිත් පෙල හරක් හුන්කල්
(හි ඒ තිත් ගණ
දක්මින් එක් පෙදෙසෙක්හි ඔත් ගජ කැලන් තො
(ස්මින් නිකුත් සෙල් කුලෙන්
දක්වා සිවිලසක් නිකුත් ගැවෙ ගෙරින් දේනා එ
(තුන් ලෝතුමා

ගොස්, (ශ්‍රාවස්තියෙහි ප්‍රාතිහාර්‍ය්‍යකාරම්භයක්කිරීමා නාටට) ගොසින්, මඩුවක්නන්වා, මඩුවක්අත්ලස් දීනන්වා, (ඒමන්ඩපය) ඉඳුවරින්සඳ, නීලොත්පලයෙන්, (ඒමඩුව) සරහා, සෑසීමවාසිකියා, සාහසිකවවිගබස්තෙපලා, අපිත්පෙලහරක්දක්වම්හය කියමින්, (යමක) ප්‍රාතිහාර්‍ය්‍යඅපිත්ලෝකයාහටප්‍රකාසකරම්හයිකියමින්, ඒතිත්ගණ, එතිර්ත්‍ථිකාසමූහයා, හුන්කල්හි, (ඒමඩුපයෙහි) හුන්නාවූකාලයෙහි, එක්පෙදෙසෙක්හි, එක්ප්‍රදෙශයෙක්හි, ඔත්ගජකැලන්, (රැස්ව) ගොත්තාවූහස්තිසමූහයෙක්, දක්මින්, අවලෝකනයකෙරෙමින්, තොස්මින්, සන්තෝෂවෙමින්, සෙල්කුලෙන්නිකුත්, ශෛලකුහරයකින්නිෂ්ක්‍රාන්තවූ, සිවිසල්දක්වා, සිංහලීලාවක්දක්වා, දේනාවෙහෙරින්, ජෙතවනවිහාරයෙන්, එතුන් ලෝතුමා, ඒත්‍රෛලොක්‍යනාථවූ ස්වාමිතෙම, නිකුත්යැ, නික්මිනි—

( 43 )

දනාවිජ් ඒ උතුමා තා අඹපලක් දුන්නේ උයන්
(පල් එ කල්
ගෙන් මින් එබුදිමින් බිපුත් ඔවුලවා, උන්වාම ගුන්
(කල් එ කල්
දිස් නාලෙස් එව්ගස් නැගෙත් ගඬඹරුක් නාන්දි
(ක් නිකුත් සා සි යෙ න්
මල් පල් ලෙන් සසිරි දකුත්ම දෙනරැස් රැස්වූ අවු
(ත් නා න් දෙසි න්

ඒ උතුමා, ඒ උතතම වූසර්‍වඥයා, දක්මින්. (එඩනාමා ලීයේ) දූන. උයන්පල්, උද්‍යානපාලතෙමෙ, තමා අඹපලක්, තමා (ගෙණයන) ආම්‍රඵලයක්, එකල් ගන්මින් එසමයෙහිගෙණ, දුන්නේ පිලිගැන්විය, ඒගන්මින්, ඒපිලිගෙණ. බූදිමින්, අනුභවකොට. බිපුත්, (ආමුඵලයෙහි) ඇටය, ඔහුට්වා, ඒඋද්‍යාන පාලයාලවාම, උන්වාම්හුන්කල්, (භූමියෙහි) බීජ රෝපනයකරවාගුන්කල්හි, එකල් (වැඩුණ්) සමයෙහි, දිස්නාලෙස්, ලෝකයාහටප්‍රකාසවනාලෙස, එව්ගස්, ඒක්‍ෂණයෙහිම, නාන්දික්නිකුත්, නානා දිසාවටනික්මුනාවූ, සාසියෙන්, ශාන්වාශතයෙන් ද, මල්පල්ලෙන්සිරිස, මල්ගාපලලාවයෙන්සශ්‍රිකාවූ, ගඬඹරුක්, ගඬම්වනාම්ආම්‍රද්‍රමය, නැගෙන්, (පොලොවෙන්පැන) නැගාවූකල්හි, දකුත්ම, (ඒ) බල මින්, නාන්දෙසින්අවුත්, නානාදිසාවෙඅවිදින් දනරැස්, ජනාසමූහයා, රැස්වූ, (එතැන්හි) රාසිභූතවූ

( 44 )

දූසැස් ගොස් මඬුවක් රුවින් මුව මවා නාන්වා කසු
(න් නාන් කො ගෙ ල්
පන්වා හෙම් සිගසුන් වලෝලඹු දුදි තන් තන් හිදල්
(වා වැ මූ ප්
දූන්වී ඒවර සූන් සුගත් සුලකෙලේ සක්දෙව් දෙ
(දෙව් ලෝ සුර න්
ගෙන්වා ගොස්නුබකුප් පුරන්නි එසිරි දිස්නා මව
(ස් රැස් කො ලේ

දසැස්ගොස් ශක්‍රදිව්‍යරාජයාගෙසින්, රුවන්මූව, රත්නමයවූ මඬුවක් මණ්ඩපයක් මවා, නිර්මාණයකොට, නන්කසුන් කෙහෙල් නන්වා, නොයෙක්සවණ්ණපතාකත් නන්වා, ගෙඩිකසුන් කනකමයසිංහාසනයක්, පණ්වා (එකි) පනවා, තන්තන්හි එඑකොනයන්හි, මලෝලඹුදී, කුසුමදමයන්එල්වා, වැඩුජ්දල්වා, පහනුදදල්වාදූන්වී, සර්‍ඥයන්පිලිගන්නාපරිද්දෙන්ශක්‍රයා) ආරාධනාකලේය, ඒවරයුන්, ඒඋතතාමවූසිංහාසනය. සුගත්, තථාගතතෙම, සුලකෙලේ, අලංකාරකෙලේ, (හෙවත්) එහිමවැඩ හුන්නේය, සන්දෙව්, ශක්‍රදේවරාජතෙම, දෙදෙව්ලෝසුරන්, දෙදිව්‍යලෝකයෙහි දේවතාවන්, ගෙන්වා, කැඳවාගෙණ, සිරිදිස්නාවස් (ඒසර්‍ඥයන්ගේ) ඓශ්වර්‍ය්‍යදක්නාපිනිස, නුබකුස්පුරමින්, නාහොමාශීඃපුරමින්, රුස්කෙලේ, රාසිභූත කරවී

( 45 )

දස නුදෙස නිකුත්රුස් රුස් සහස් රුස්හු දක්මි න්
දිගඑකලක දොසින් මේ ගොයුම් ගොත්හු දූක් වූ
පෙලහැර පැවිසුන් වස් රුස්වහුන් තිත් දනා රුස්
දූකනොස හනා සක් දෙව්වා මැවීඒ සකොස්ගො ස්

දසනුදෙස, දිසානුදිසාවෙහි නිකුත්, නිස්ක්‍රාන්තවූ, රුස්රුස්, රස්මිසමූහයඇති, සහස්රුස්හුදක්මින්, සහස්‍රරුස්මිහුදූකා, දිගඑකල, දිගාන්තරාලෝකකලාවූ, කදොසින්, බදේ‍යාතකාන්තීන්, මේගොයුම්ගොත්හුදූක්වූ, මේගෞතමගොත්‍රයෙහිසවාමීහු දක්වනලද, පෙලහැරපැවසුන්වස්, ප්‍රාතිහාර්‍ය්‍යදක්වනුපිනිස, රුස්වහුන් එකතැන්වහුන්නාවූ, තිත් අනාරුස්, තීර්ථකජනසමූහයා, උකනොසහනාසක්දෙව්, බලා (මොවුන්ගේවිකාර) ක්ෂමාකොටගත

නොහෙනාශක්‍රාදිවෘරජතෙම, වාමැවි, (ප්‍රවඩ) වා තයන්නිෂ්ඨානායකලේ, ඒසකොස්ගොස්, ඒමාරුතය වහාගොසින්

( 46 )

විසුරුවමිනු පුල්මල් ඒ නිවෙස් නන් දිගත් හී
විහිද නොමදමී රෙණු රුස් ඔවුන් ගත් හිගැල් වී
දලදල බිඳුවස් වාලා වලා දෙව් සදුල් වෙ ස්
හරණ කාරණ තිත් රුස්වල් හිසෝනා කොලේගොස්

උපුල්මල්, නිලොත්පල (ජදනයසොයාතුබූවා) විසුරුවමින්, (සුනුවිසුනුකොට) වගුරවමින්, ඒනිවෙස්නන්දිගත්හි, (ඒතිඹීකයින්හුන්නාවූ) මණ්ඩපයනානාදිගටසිඳබිඳදමමින්, නොමද, බොහෝවූ, මීරෙණුරුස් ධූලිසමූහයෝද, ඔවුන්ගත්හි, ඒතිඹීකායන්ගේශරීරයෙහි, ගැල්වී, ලිම්පනයකොලෙ, වලාදෙව්, මෙඝවලාහකදිව්‍යපුත්‍රතෙම, දලදලබිඳුවස්වා, මහත්ජලබින්දුවර්ෂණයකොරෙමින්, සඳුල්වෙස්හරණකාරණ, ශාර්දූලාකෘතිකාරණ ශරීරඇතිව, (හෙවත්) දිවියන්සැටිව, තිත්රුස්, නීඹීකරපිය, වල්හිසෝනාකොලේගොස්, වල්වදනාවූන්කොලේ.

(47)

සමුඩු එමඩු මේලෙස් වත් තමන් බස් නොබස් වත්
යනමගමගමින් උන් ගත් නොයෙක්වෙස් එතිත් රුස්
ඔසල කෘඥල පස් රුස් රුස්වගුන් ඒ සිවල් රු ස්
සිරිසර හැරපාමින් නන් දිගත් හිමයත් ය ත්

සමුඩු, සමාඩවූ, එමඩු, (තමගේ) ඒමඩාපය, මේලෙස්වත්, උක්තප්‍රකාරලෙසවත්, තමන්බස්නොබස්වත්, තමන්කීබසටසුදුසුබස්නොවෙත්ය, යනමගමගමින්. පලායන්ටසුදුසුමාගීබලමින්, උන්ගත්නොයෙක්වෙස්, උන්විසින්ගණ්ණලද, (මුත්තකෙෂාදී) නොයෙක්වෙස්ඇති, එතිත්රුස්, ඒනීඹීකරා

ෂිය, (සිදිබිදිගියාවූඒමණ්ඩපයෙ) ඔසල රසීභූතවූ, නානාලරැස් කාවරසමූහඇති, පස්රැස්, පස්ගොඩක්හි රැස්වගුන්, රශ්මිභූතවගුන්නාවූ, ඒසිවල්රැස් ශෘගාලසමූහයාක්ගුගේ සිරිසරන්, සාරවූනොහාවානාවූවන්, හැරපාමින්, අභිමුඛනොටදක්වමින්, නාන්දිගන්හි, නානාදිගාන්තරයෙහිම, යත්යත්, පලායත්, පලායත්~

( 48 )

දිගඹරඇදුරා ගෙස් කී එවා සිමා සැසී
පුලිනකලගෙලේදී වන් එවල් විල් සිලිල්හී
පවිවුනිවවු නොක්වූ නාන් දිගත් යත් මෙලෙස්පෑ
පෙලහැරපැවසුන් විස් සක් යදුත් පාමුදුන්දී

දිගඹරඇදුර, දිගම්බරචාර්‍ය්‍යයා, (භගවත්)නිගණ්ඨනාථපුත්‍රයා, එසෑසිමගොස්කීවාසී, ඒ සාහසිකව (ප්‍රාතිහාර්‍ය්‍යකරණපිනිසම) ගොසින් කීවාවූවාසිඇත්තො, පුලිනකලගෙලෙදී වැලිකඩයක්ශ්‍රීවයෙහිබැඳ, එවල්විල්, එතැනාසමීපයෙහිතටාකයෙක්හි, සිලිල්හිවන් දියෙහිගැලීගියේයි, පවිවුනිවවු, පාපිෂ්ඨ (සවභාවූ) ඒ මුග්ධලෝකයා, මෙලෙස්පෑනාන්දිගන්යත්, උක්තප්‍රකාරයෙන්ප්‍රාතිහාර්‍ය්‍යපා ඒ ඒ දිගට (භිතීන්) පලායත්ම, පෙලහරපැවසුන් ස්, සමකප්‍රාතිහාර්‍ය්‍ය දක්වනුපිනිය,පාමුදුන්දී.(සර්වඥයන්ගේ(ශ්‍රීපාදම්සතකයෙහිතබා, (භගවත්) වැඳ, සක්දුන්, ශක්‍රදෙවරාජයා ආරාධනාකරත්~

( 49 )

පරවැඩඇදුරණෝ ලෝසියල් එක් නොතානෝ
දියටෙක විදතානෝ පොක්පුරේ එක් රජ නෝ
බවසිදු පසුරණෝ තිත් නාලන් මිත් ගජනෝ
සුරණර ඉසුරණෝ සව්සැපත් කප්රැ කා නෝ

පරවැඩඇදුරණෝ, පරතීර්ථකාචාර්‍ය්‍යයෙහිආචාර්‍ය්‍යවූ,

ලෝසිසල් ලෝකවාසීසියල්ලන්ට. එක්නෙතාණෝ, අසහායනෙත්‍රයක්වූ, දියෙවෙක සම්පත ලෝකයට, විධාතාණෝ, අසහාසවියන්වූ (භගවත්) නුවනැත් තාවූ, මොක්පුරේ, නිර්වාණපුරයෙහි, එක්රජාණෝ, අතුල්‍යසමවිවූ, බවසිදු, සංසාරනමැතිසාගරයට, පසුරණෝ නාවූතාවූ තිත්නාලන්, තීර්ථකනමැති රණහුනාවනායට, ඡත්ගජාණෝ, මිතතාගසතිවූ සූර ණර, දිව්‍යමිනුෂ්‍යසන්ට, ඉසුරාණෝ, ජ්‍යසවරවූ සවි සැපත්, සියළුසම්පත්තියට, කර්ත්‍රෘතාණෝ, කල්‍යා දුමවූ—

( 50 )

අවිදු සකර පස් ඇමින් කිඹුල් ඇකුලෙන් ස න්
බවඝොරසසුරේ ඈ ගෙහ් විලස් සෙත්තෙරේ හා
දෙපසිනි අගපත්වූ යා පෙලින් යුත් මෙරින් වූ
නිවිමුහිරුවින් නන්සක් මනක් සක් වද්‍රෙසි

මුනි, සර්වඥතෙම, අවිදුසකරපස්ඇ, අවිද්‍යාපච් චයාසංඛාර, සඛාරපච්චයා, යනාදීන්, මින් කිඹු ල්ඇකුලෙන්සන් මසනසකුම්භිරමකරාදීවූසමූහයා විසින්රජිතවූ (භගවත්) ගැවසිගත්තාවූ, බවඝො රසයුරේඈ, සංසාරඝොරසාගරයෙහිඈ මෙරින්වූ, නිර්රුපචිතමවනාඳ, සේනුගේවිලස් සෙත්තෙරේ හා, ශාන්තිතීරයෙන්සේතුයාදූපරම්පරාවෙන්යුක්ත වූ, නන්රුවන්, නානාරත්නමයවූ, සක්මනක්, චංක්‍රමනයක්, සක්වද්‍රෙහි චක්‍රවාටගර්භයෙහි, නි මවි නිර්මාණයකොළේ, (භගවත්) රුවන්සක්මනා ක්මැවූ සේකි—

( 51 )

සුරිඳු සරසු නොක්කල් වත්නොවත් රුවිලස්වන්
රුවිනු දුල එසක් මෙන් පත් එසක් මෙන් තිලෝනා
ඝසල ගුණ රුවන් රැස් ගත්සිරි නිදු ගබිහි
එසඳ දැරඹියා ගත් සක්රුවන් මෙන් පසස් නා

සූරිඳුසරයුන්, ඉඳුවාපය, එක්කොට, එක්සමයෙහි, වක්නොවත්, ඉදින්වන්නේනොව, (සෘජු ආකාශයෙහි එවහොත්) රුවිලස්වන්, (ඉඳුවාපයෙහි) ලීලාවක්බඳුවූ, රුවිනුදුලඑසක්මන්, රත්නයෙන්උපුලිතාවූ, ඒවංක්‍රමනාගෙහි, පත්එසක්මින්, පැමිණිවූ ගමන් ඇති, තිලෝනා, ත්‍රෛලොක්‍යස්වාමිතෙම, ඔසල, රැස්වූ, ගුණරුවන්රැස් (මෛත්‍රීක්ෂමොපසමාදී) ගුණනාමැතිරත්නයන් මූහුඇති, ගත්සිරින් (සර්වඥයංගේ) දේහශොභානැති නිදුගත්හි, සාගරාභ්‍යන්තරයෙහි, සාගත්, ගමන්ගත්තාවූ, පසස්නා, (ලෝකයාවිසින්) ප්‍රශස්තවූ, සක්රුවන්මෙන්, චක්‍රරත්නපරිදෙදන්, එසඳ, එසමයෙහි, වැටහි, පැලඹියේයි.

( 52 )

පෙළහර පැවසූන් වස් දැන්හි සිත් ලත්සුගත් ඒ
අඟපසඟ තුරෙන් යත් යත්හුතැස් රැස් සිලිල් හා
විදුකළ ඹස හස්නෙනන් සත්විලස් නෙන්ගුවන් වී
සුගතනළ වෙයින් සුත් හි දුලෙස් මෙන් දිගත් වී

පෙලහරපැවිසුන්වස්, ප්‍රාතිහාර්යකරණුපිනිස, ඒසුගත්, ඒසර්වඥයන් දැන්හිසිත්ලත්, (චතුර්ථ) ධ්‍යානසිතයවන්නෙන්, අඟපසඟතුරෙන්, අංගප්‍රත්‍යංගඅතුරෙන්, (භවත්අභ්‍යන්තර) හස්තපාදාදීන්අතුරෙන්, හුතැස්රැස්සිලිල්හායත්හත්, ජලද්‍රවභාවගිනිකඳන්ධාරාන්යත්ම, විදුකලඹසහස්නෙන්, විද්‍යුත්කලාපසහශ්‍රයෙන්, සන්විලස්නෙන් සංවනනාවූවිලාසයක්පරිදෙදන්, ගුවන්වී ආකාසයවීය, සුගතනලවෙයින් සුගාන්තමාරුතවේගයෙන්, සුත්, සුක්තවූ, හිදුලෙස්මෙන්, සාගරවිලාසයක්මෙන්, දිගත්වී, දිගාන්තවී.

( 53 )

නලල නෙතහු තැස්නෙන්දෙව්ගඟුල්ලේ වැටිමෙන්
පැහසර ඉසුරුමෙන් අන්නොදිස් නානැටි මෙ න්
මමනාඇලි සියෙන්හා රත්දරින් හෙම් කුලක්මෙ න්
වනාතිදද සදෙව්ලෝ තෝර්හු තැස්යුත් ඒදම්   නා

නලලනෙතහුතැස්නෙන්, ලලාටලෝචනාග්ණියෙන්, දෙව්ගඟුල්ලේවැටිමෙන්, ආකාසගංගාවිතීනයෙන්ද, නැටිමෙන්අන්නොදිස්නා, නෘත්‍යයෙන් අවකාසාන්තයක්නොදක්නාවූ, පැහසර, ප්‍රභාසාරවූ, ඉසුරුමෙන්, ඊශ්වරයාපරිදෙදන්, මමනා, වැහෙන්නාවූ, ඇලිසියෙන්හා, නිර්ඣරශතයෙන්හා, රත්දරින්, ගෛරිකධාරාවන්කරණකොටගෙණ, හෙම්කුලක්මෙන් කනකගිරිපර්වතයක්මෙන්ද, තෝහුතැස්, (ඉදුරුවැහෙන්නාවූ) ජලධාරාවග්ණිස්කන්ධයෙන්, යුත්, යුක්තවූ, ඒදම්නා, ඒධාමීස්වාමීහු දදදෙව්ලෝ, මුග්ධවූදිව්‍යමනුෂ්‍යයන්වනති, වර්ණණකෙරෙත්

( 54 )

ඒමුනි යුවිලසින්හා නාසිදෙන් කන් බිලෙන්   හා
අඟපසඟතුරෙන්හාලොම්කුයෙන්ලොම්කුයෙන්හා
